# ජාතික ඖෂධ නියාමන අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකිය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත තනතුරු වේ. ජාතික ඖෂධ නියාමන අධිකාරිය කොළඹ පමණක් පිහිටා ඇති අතර වෙනත් ශාඛා කාර්යාල නොමැති බැවින් ස්ථාන මාරු වීම් රහිත වේ.

## 1. අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) – (පුරප්පාඩු 01)

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම

සමග

මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ රාජ්‍ය කළමනාකරණය/ වාණිජ්‍යය විෂය ක්ෂේත්‍රයෙන් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :- (පහත සඳහන් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකාර සේවා (MM) සේවා ශ්‍රේණියෙහි I වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

**වයස :**

අවු: 35 ට නොඅඩු හා අවු: 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**තනතුරට අදාළ වැටුප් පියවර :**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව HM 1-1 රු: (140,640 – 15X4,100 – 202,140) වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට නියමිත වැටුප් පියවර වන රු. 123,019/- හා අනුමත දීමනා

**බඳවා ගැනීමේ ක්‍රමය :**

පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන පරිදි පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙනි.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීම පහත දැක්වෙන පරිදි වේ.

| | |
|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | - ලකුණු 30 |
| අදාළ අතිරේක අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් | - ලකුණු 30 |
| අනෙකුත් කාර්යය සාධනයන් හා කුසලතා | - ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී කාර්ය සාධනය | - ලකුණු 25 |
| **මුළු ලකුණු ගණන** | **100** |

## 2. ජීව වෛද්‍ය ඉංජිනේරු

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉංජිනේරු (යාන්ත්‍රික/ විදුලි)/ ජීව වෛද්‍ය ඉංජිනේරු හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එක (01) ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහාවන සුදුසුකම් සපුරා තිබීම.

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**තනතුරට අදාළ වැටුප් පියවර :**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව MM 1-1 රු: (91,690 – 10 X 2,480 – 15 X 3,450 – 168,240) වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට නියමිත වැටුප් පියවර වන රු. 81,710/- හා අනුමත දීමනා

**බඳවා ගැනීමේ ක්‍රමය :**

විවෘත තරඟ විභාගයක් හා / හෝ පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙනි.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීම පහත දැක්වෙන පරිදි වේ.

| | |
|---|---|
| අදාළ පළපුරුද්ද | - ලකුණු 30 |
| අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම් | - ලකුණු 30 |
| අනෙකුත් කුසලතා/ කාර්යය සාධනය | - ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | - ලකුණු 25 |
| **මුළු ලකුණු ගණන** | **100** |

## 3. සහකාර ඖෂධ ඇගයීම් නිලධාරී – (පුරප්පාඩු 02)

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඖෂධවේදී හෝ විද්‍යාවේදී ඖෂධවේදී (Bachelor of Pharmacy/ Bachelor of Science (Pharmacy)) ප්‍රථම උපාධියක් ලබා තිබීම.

   සහ

   ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිවී තිබීම.

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක ඖෂධවේදී උසස් ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

   සහ

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් ඖෂධ නියාමන ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

   සහ

   ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහාවන සුදුසුකම් සපුරා තිබීම.

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**තනතුරට අදාළ වැටුප් පියවර :**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව JM 1-1 රු: (72,650 – 10 X 1,360 – 18 X 2,040 – 122,970) වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට නියමිත වැටුප් පියවර වන රු. 65,633/- හා අනුමත දීමනා

**බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත තරඟ විභාගයක හා / හෝ පත්වීම් බලධරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙනි.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීම පහත දැක්වෙන පරිදි වේ.

| | |
|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | - ලකුණු 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | - ලකුණු 30 |
| වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | - ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | - ලකුණු 25 |
| **මුළු ලකුණු ගණන** | **100** |

## 4. සංවර්ධන නිලධාරී (පුරප්පාඩු 01)

**අධ්‍යාපන සුදුසුකම්:**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීති/ මානව සම්පත්/ තොරතුරු තාක්ෂණය/ මූල්‍ය/ ගණකාධිකරණය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

**වයස :**

අවු: 22 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**තනතුරට අදාළ වැටුප් පියවර :**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව MA 3-2025 රු: (53,940 – 10X800 – 11 X 1,190 – 10 X 1,320 – 5 X 1,350 – 94,980) වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට නියමිත වැටුප් පියවර වන රු. 49,831/- හා අනුමත දීමනා

**බඳවා ගැනීමේ ක්‍රමය :**

තනතුරට අදාළ වන පරිදි වූ ලිඛිත තරඟ විභාගයක හා / හෝ පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙනි.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීම පහත දැක්වෙන පරිදි වේ.

| | |
|---|---|
| අදාළ පළපුරුද්ද | - ලකුණු 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | - ලකුණු 30 |
| වෙනත් කාර්යය සාධනයන් / කුසලතා | - ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | - ලකුණු 25 |
| **මුළු ලකුණු ගණන** | **100** |

**වෙනත් කරුණු :**

**සෑම ඉල්ලුම්කරුවෙක් ම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.02.14 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ප්‍රධාන විධායක නිලධාරී, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථා ගොඩනැගිල්ල, 02 වන මහල, අංක 130, ඩබ්.ඒ.ඩී.රාමනායක මාවත, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. තැපැල් කිරීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **අයදුම් කරන තනතුර පැහැදිලිව** සඳහන් කළ යුතුය.

**සභාපති,**
**ජාතික ඖෂධ නියාමන අධිකාරිය.**

## ජාතික ඖෂධ නියාමන අධිකාරිය

### ................................ තනතුර සඳහා අයදුම්පත

1. පෞද්ගලික තොරතුරු :
   - 1.1. සම්පූර්ණ නම :-
   - 1.2. මුලකුරු සමග නම:-
   - 1.3. ස්ත්‍රී/ පුරුෂ භාවය:-
   - 1.4. උපන් දිනය:-
   - 1.5. වයස:- අවු:............... මාස: ................ දින: ................
   - 1.6. ජාතික හැඳුනුම්පත් අංකය:-
   - 1.7. දුරකථන අංකය :- ස්ථාවර: ...................... ජංගම : ........................
   - 1.8. විද්‍යුත් තැපැල් ලිපිනය
   - 1.9. ලිපිනය:-
   - 1.10. පදිංචි දිස්ත්‍රික්කය:-
2. විභාගයට පෙනී සිටින මාධ්‍යය:-
3. අධ්‍යාපන සුදුසුකම්: (ඉහළම සුදුසුකමේ සිට අනුපිළිවෙලට සඳහන් කරන්න)

| අනු අංකය | සුදුසුකම | විශ්වවිද්‍යාලය/ ආයතනය | සම්පූර්ණ කරන ලද දිනය / වලංගු දිනය | විෂයයන්/ සාමාර්ථය |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |

4. වෘත්තීය සුදුසුකම් :

| අනු අංකය | සුදුසුකම | විශ්වවිද්‍යාලය/ ආයතනය | සම්පූර්ණ කරන ලද දිනය / වලංගු දිනය | විෂයයන්/ සාමාර්ථය |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |

5. පළපුරුද්ද : (දැනට දරන තනතුරේ සිට අනුපිළිවෙලට සඳහන් කරන්න)

| අනු අංකය | තනතුර | ආයතනය | කාල සීමාව |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |

6. අයදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක හා ලිපිනයන්:
7. අයදුම්කරුගේ සහතිකය:

   මෙහි ඉහතින් දක්වා ඇති මා පිළිබඳ තොරතුරු මාගේ දැනීම, විශ්වාසය අනුව නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරමි.

දිනය : ................................

(අයදුම්කරුගේ අත්සන)

8. රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් තම ආයතන ප්‍රධානියාගේ සහතිකය:

   මෙම ඉල්ලුම්කරු වන ........................................ මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ ........................................ වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක ලෙස සේවය කරන බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි බවත් දන්වමි.

........................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව)

සැළකිය යුතුයි :

**අදාළ ආකෘතියට අනුව පමණක් අයදුම්පත්‍රය සම්පූර්ණ කර එවිය යුතු අතර** ඔබගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකපත්‍ර වල පිටපත් අයදුම්පත්‍රය සමඟ යොමු කළ යුතු වේ. මෙම ආකෘතියට අනුව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත්, අදාල සහතික පත්‍ර වල පිටපත් අමුණා නොමැති අයදුම්පත් හෝ අයදුම්පත් භාර ගන්නා දිනට සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනෙන් පසු යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.